# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1915/14 - 2015 මැයි මස 19 වැනි අඟහරුවාදා - 2015.05.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

මගේ අංකය :- 01/10/03/04.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර ඇම්. පී. ජයසිංහ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරි කේ. ඒ. බී. සෙනෙවිරත්න මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව 2014.12.09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ වැඩ බැලීමට.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරි ආර්. එම්. පියදාස රත්නායක මහතා 2010.07.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්,

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරි එම්. එම්. විජේනායක මහතා 2015.02.02 දින සිට ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

04. ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිනි එම්. ඊ. සුමිත්‍රා සිල්වා මහත්මිය 2015.01.28 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

05. ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණී මහත්මිය 2015.02.28 දින සිට 2015.03.15 දින දක්වා විදේශ ගත වන බැවින්, 2015.02.28 දින සිට ඒ මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිනි ආර්. එම්. එස්. ඩී. රත්නායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

06. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරිනි වයි. කලෛයි අරසි මහත්මිය 2015.03.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ ක්‍රීඩා, යෞවන කටයුතු, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත, වතු යටිතල පහසුකම් හා වතු අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති ද්‍රවිඩ මාධ්‍ය අධ්‍යාපන ඒකකයේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ (ද්‍රවිඩ මාධ්‍ය අධ්‍යාපන) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

07. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරී ඩබ්. වී. පී. නන්දපාල මහතා 2015.04.08 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ වශයෙන්.

08. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරී ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න මහතා 2015.04.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

09. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරී ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න මහතා 2015.04.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි) තනතුරේ වැඩ බැලීමට.

10. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිනී එස්. රණසිංහ මහත්මිය, 2015.05.06 වන දින සිට, ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස් වශයෙන්.

11. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරී සුමිත් සුරවීර මහතා 2015.05.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස්/පුහුණු) තනතුරේ වැඩ බැලීමට.

12. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරිනී ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණී මහත්මිය, 2015.05.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

13. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරිනී ආර්. එම්. එස්. ඩී. රත්නායක මහත්මිය, 2014.10.15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) තනතුරේ පූර්ණ කාලීනව වැඩ බැලීමට.

14. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරී ඩබ්ලිව්. රන්දෙණිය මහතා 2014.11.17 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බදුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

ඇම්. පී. ජයසිංහ,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2015 මැයි මස 18 වැනි දින,
බදුල්ල,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

06 - 56

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.